# පරිසර හිතකාමී ආර්ථික සංවර්ධනයක් කරා .......

## ◆ පසුබිම

සංවර්ධනය සඳහා පාරිසරික සාධක පිළිබඳව සළකා බැලීමේ වැදගත්කම පිළිබඳව අද ශ්‍රී ලංකාවේ වැඩි අවධානයක් යොමු වී තිබේ. මනා ලෙස පරිපාලනයක් නොකරන ලද්දේ නම් සියළුම සංවර්ධන ක්‍රියාදමයන්ගෙන් පරිසරයට හානි සිදුවන ආකාරයේ පාරිසරික බාධාවන්, ගැටුම් හා අසමතුලිතතා ඇතිවනු ඇත. සියළුම සංවර්ධන ක්‍රියාදමයන් කැපී පෙනෙන හෝ නොපෙනෙන හෝ වුවද පරිසරයට බලපෑම් ඇතිකරයි. පරිසරයට සිදුවන බලපෑමෙහි බරපතල බව සඳහා එහි ප්‍රමාණය, ස්වභාවය, පිහිටීම සහ වෙනත් බොහෝ සාධක බලපායි. කෙසේ නමුදු දිගු කාලයක් පුරා පරිසරයට සිදු වූ බලපෑම් පිළිබඳව සුදුසු ආකාරයේ අවධානයක් යොමු නොවූ අතර, පරිසරය දයාදයක් ලෙස සැළකූ ඔවුහු එබඳු ක්‍රියාමාර්ගයන් හේතු කොට ගෙන ස්වභාවික සම්පත් ඉතා ඉක්මනින් ක්ෂය වේ යැයි කිසි විටෙක නොසිතූහ.

පාරිසරික ගැටළු වලට විසඳුම් සෙවීමේ අවශ්‍යතාව වැදගත් වී ඇති අතර ඒ සඳහා විසඳුම් සෙවීම හදිසි මෙන්ම අත්‍යාවශ්‍ය වූවකි. මෑත කාලීනව පරිසරය පිළිබඳ දැනුම අප සමාජයේ සියළුම ස්තරයන්ට ව්‍යාප්ත වූ නමුදු එය කෙතරම් දුරට සමාජය තුළට කිඳ බැස ඇතිද නැතහොත් එය කෙතරම් දුරට පුද්ගල චර්යාවට සජීවී බලපෑමක් ඇති කරනවාද? යන්න විශේෂයෙන්ම ප්‍රතිපත්ති සාදන්නවුන් හා කළමනාකරුවන් විසින් දැන් නිරීක්ෂණය කළයුතුව ඇත.

## ◆ අභියෝගය

වර්ධනයට, එහි ක්‍රියාවලියට සහ රටාවට නව්‍ය වූ ආකාරයක පිවිසුමක් නිර්මාණය කිරීම අභියෝගයකි. පරිසරය යන්න, තවදුරටත් වර්ධනයෙන් වෙන් වූ හෝ වෙනස් වූවක් නොවේ. පරිසරයට ධන ආකාරයේ හෝ ඍණ ආකාරයේ බලපෑමක් සිදුවන්නේ වර්ධන ක්‍රියාවලිය තුළිනි. එබැවින් පරිසර ආරක්ෂාව හා කළමනාකරණය යන්න සම්පූර්ණයෙන්ම සාක්ෂාත් කරගැනීමට හැකි වන්නේ එය, වර්ධනය තීරණය කරනු ලබන බලවේග රාශියක් වශයෙන් ඒකාබද්ධ කිරීමෙනි.

ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් බොහෝ සංවර්ධනය වන රටවල් පාරිසරික ගැටළු දෙකකට මුහුණපානු ලබන අතර ඒවා ප්‍රධාන වශයෙන් ඌණ සංවර්ධනය හා දුගී බව හේතුවෙන් පැන නගිනු ලබන ගැටළු හා කඩිනම් කරන ලද සංවර්ධන ක්‍රියාමාර්ග හේතුවෙන් පැන නගින ගැටළු ලෙස වේ. සංවර්ධිත රටවල් නවීන විද්‍යාත්මක හා තාක්ෂණික සොයා ගැනීම් හේතු කොට ගෙන ඇති වූ පාරිසරික ගැටළු වලට මුහුණ දෙනු ලබන අතර ඒවා නිසි ආකාරයේ පෙර අවධානයකට ලක්ව තිබිණි නම් මගහරවා ගත හැකිව තිබුණ ද ආරම්භයේ සිටම ඒවා පාරිසරික ගැටළු වී තිබේ.

## ◆ කාර්මීකරණය හා ආර්ථික සංවර්ධනය

ආර්ථික සංවර්ධනය සඳහා වන කාර්මීකරණය මෑත කාලීනව රජයේ ප්‍රධානතම ප්‍රතිපත්තියක් වී ඇත. මෙමගින් මුළු රට පුරාම සිය ගණනක් පුද්ගලයන්ට රැකියා අවස්ථා හා ද්‍රව්‍යමය සහනයන් සපයා ඇත. කෙස් නමුදු මෙම ක්‍රියාවලිය මගින් වාතය ජලය හා භූමිය වැනි ස්වභාවික ජීවය සඳහා උපකාරී වන පද්ධතිවලට අහිතකර බලපෑම් ඇති කරනු ලබන කාර්මික දූෂණය ඇති කර තිබේ. එබැවින් ජනතාවගේ සුභසිද්ධියට හා ජාතියෙහි ආර්ථික සංවර්ධනය කෙරේ බලපෑමක් ඇති ප්‍රධාන ප්‍රශ්නයක් බවට පාරිසරික ආරක්ෂාව හා කළමනාකරණය පත්ව ඇත.

***" කලාපීයකරණයෙහි මූලික පියවරෙහි දී, වනාන්තර, රක්ෂිත අභය භූමි, තෙත් බිම්, පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික වශයෙන් වැදගත් බිම් ආදී පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ ඇතිදැයි යථාපරිදි සොයා බැලිය යුතු අතර මේවා මූලික සැළසුම් පරීක්ෂණ ලැයිස්තු හෝ කෙටි සැකසුම් වල අන්තර්ගත කළ යුතුය."***



මෙම සංකල්පය ප්‍රථම වරට අවධානයට ලක් වූයේ 1972 ස්ටොක්හෝම් හි පැවති පරිසර හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රථම සම්මන්ත්‍රණයේදීය. මෙම සම්මන්ත්‍රණය මගින් විද්‍යාඥයන්, ආර්ථික විද්‍යාඥයන් හා ප්‍රතිපත්ති සැලසුම් ශිල්පීන් වෙත පාරිසරික මානයන් අනුව මූලික මට්ටමේ සංවර්ධන සැළසුම් ක්‍රියාවලිය කෙසේ සකස් විය යුතුද යන්න පිළිබඳව යම් අදහසක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාව ඇතුළු දියුණු වෙමින් පවත්නා රටවල් සියල්ලෙහි ඉහළ යමින් පවත්නා දූෂණය හේතු කොට ගෙන මිනිසුන් විශාල ප්‍රමාණයකගේ ජීවන තත්ත්වය ඔවුන් සාමාන්‍යයෙන් ජීවත් විය යුතු අවම ජීවන තත්ත්වයට ද වඩා පහල මට්ටමකට ඇද වැටීමට ලක්ව ඇත. ජීවත් වීමට අවැසි මූලික මිනිස් අවශ්‍යතාවන් වන ආහාර, නිවාස, ඇඳුම්, සෞඛ්‍යය හා සනීපාරක්ෂක පහසුකම් පවා ඔවුන් වෙත ලැබී නොමැත. මෙම අත්‍යවශ්‍යවූත් නිතරම පාහේ සිදුවන්නාවූත් සමාජ හා ආර්ථික සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස ස්වභාවික සම්පත් භාවිතය ඉහළ යාම හේතුවෙන් පරිසරයට හානි පැමිණ ඇත. එලෙසින්ම පරිසරය එනම් බොහෝ විට ස්වභාවික සම්පත් කෙටි කාලීන ආර්ථික අවශ්‍යතා සඳහා විනාශ වී යයි. එබැවින් ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවත්නා රටවල තම සංවර්ධන උත්සාහයන් හැසිරවිය යුත්තේ පරිසරය රැකබලා ගැනීම හා වර්ධනය කිරීම යන්න තම සිතෙහි ප්‍රමුඛව දරා ගනිමින් මිනිසුන්ගේ ජීවන මට්ටම ඉහළ යන ආකාරයෙනි.

## ◆ තිරසාර සංවර්ධනය


ආර්ථික පරමාර්ථයන් හා සංවර්ධන ඉලක්කයන් සමඟ පාරිසරික පරමාර්ථ හා ප්‍රතිපත්ති වල එකඟතාව වැඩි කිරීම සඳහා ජාතික මට්ටමේ දී වඩාත් ඉක්මන් වූ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. මෙම තත්ත්වයේදී බොහෝ පාරිසරික ගැටළු විසඳුම් සොයාගත හැක්කේ සමතුලිත සංවර්ධනයක් තුලින් පමණි. සම්පත් භාවිතයේ රටාවන් නැවත හඳුනා ගැනීම, ස්වයං ස්ථාවර වූ පාරිසරික වශයෙන් යෝග්‍ය ප්‍රතිපත්ති හා වැඩ සටහන් යොදගැනීමේ ක්‍රියාවලිය තුලින් සමාජ ආර්ථික හා පාරිසරික පරමාර්ථයන් එක් කිරීම වැදගත් වේ.


අපගේ ස්වභාවික සම්පත් ප්‍රවේශමෙන් පරිහරණය කිරීමෙන් ද, විධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්ද, වන වගාවෙන් ද ප්‍රතිචක්‍රීකරණයෙන් හා සුදුසු පාරිසරික කළමනාකරණය තුළින්ද නව්‍යකරණය කළ හැකි සම්පත්, හැකි සෑම අවස්ථාවකදීම විකල්ප සම්පත් බවට පත් කිරීමෙන් ද අප විසින් යාවත්කාලීන අන්දමින් ඉදිරියට පැමිණියේ නම් ඉහත කී පරමාර්ථය මුදුන් පමුණුවා ගත හැකි වනු ඇත.

පරිසරය කෙරේ මිනිසා ගේ බලපෑම පිළිබඳව වඩාත් අවබෝධාත්මක අධ්‍යයනයක් සිදු කිරීම තුලින් භෞතික පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩිදුරටත් අවධානය යොමු කළ යුතුය.

මේ අනුව පරිසරය යන්න ආර්ථිකයට අයත් වන්නා වූ අංශ රාශියකින් එකක් ලෙස සැළකිය නොහැක. පරිසරය යන්න සංවර්ධන සැළසුම් ක්‍රියාවලියට හඳුන්වා දිය හැක්කේ, පරිසර කළමනාකරණය තුලින්

"සංවර්ධන මාවතේ ඉදිරියට" - සෙංකඩගල පුරවරය.
ඡායාරූපය : අරුණ එස්. අතුකෝරළ.





සුවිශේෂ ක්‍රියාකාරකම් කරන්නා වූ විෂයයක් ලෙසත් ආර්ථිකයේ සියළුම අංශ හරහා සියළුම සැළසුම් තීරණ ගන්නා වූ නොවෙනස්වන පරිමාණයක් ලෙසටත්ය. ආර්ථික සංවර්ධනය හා පරිසරය යනුවෙන් වෙන්ව සාකච්ඡා නොකළ හැකි ගැටළු දෙකකි. සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ඔවුන් දනට මුහුණ දෙනු ලබන්නා වූ පාරිසරික, සමාජයීය හා ආර්ථික ගැටළු විසඳ ගැනීම සඳහා ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය වේ. එනමුදු සියල්ලන්ගේම වගකීම වනුයේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ස්වභාවික පරිසරය විනාශ නොවන බවට සහතික වීමයි. මෙම ගැටළුවට විසඳුම් ලොව පුරා පැතිර සිටින පරිසර විද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇති අතර මෑතක දී 'බ්‍රන්ඩ්ලන්ඩ් කොමිසම' මගින්ද සිය 'තිරසාර සංවර්ධනය' යන සංකල්පය පෙන්වා දී ඇ.ත.

## ◆ පාරිසරික බලපෑම් ගණනය කිරීම

තිරසාර සංවර්ධනය යන සංකල්පය තුළින් පාරිසරික ප්‍රතිපත්ති ඒකාබද්ධතාව සඳහා රාමුවක් සපයනු ලබන අතර එමගින් සංවර්ධන උපාය මාර්ග එනම් විශේෂයෙන් සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික ගණනය කිරීම් ලබා දේ. පාරිසරික බලපෑම් ගණනය කිරීම් ආරම්භ වී ඇත්තේ දූෂණය හා අක්‍රමවත් සංවර්ධනය හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම් වලින් පහර කෑ බටහිර ලෝකයේය. 1970 ගණන් වල ඇමරිකා එක්සත් ජනපදයේ ආරම්භ වූ පාරිසරික බලපෑම් ගණනය කිරීමේ ක්‍රියාවලිය තුළින් තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීමේ හැකියාව ඇත.

අද බොහෝ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් පාරිසරික බලපෑම් ගණනය කිරීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරයි. එහි වැදගත්කම හඳුනාගත් ශ්‍රී ලංකා ආණ්ඩුවද අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් 1984 ජනවාරියේ දී පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයේම ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ගණනය කිරීමට විධිවිධාන පනවන ලදී.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතෙහි (ව්‍යාපෘති අනුමැතිය ඇතිව) IV ඇ කොටස යටතේ 1994/06/24 දින අංක 772/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගැසට් කරන ලද නියෝග අනුව 1993 දී පාරිසරික බලපෑම් ගණනය කිරීම සඳහා අවශ්‍ය නීතිමය ආවරණය ලබා දෙන ලදී. මෙම නියෝජන මගින් නාමික නියෝජිත ආයතන 20ක් ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදෙන නියෝජිත ආයතන ලෙස පිහිටුවා ඇති අතර මෙම නියෝග යටතේ මෙම ක්‍රියාවලිය අනුගමනය කළ යුතු නියමිත ව්‍යාපෘති/ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත.


ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්මත කරගන්නා ලද පාරිසරික බලපෑම් ගණනය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය වනුයේ සැළසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළම පාරිසරික සාධක වලට වැදගත් ස්ථානයක් දෙමින් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති මගින් පාරිසරික තත්ත්වය පහළ යාම වැළැක්වීම හා අවම කිරීමයි.

පාරිසරික බලපෑම් ගණනය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම සමහම වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය හා අනෙකුත් අදල ආයතන මගින් පරිසර අංශයේ ගෙන ඇති තවත් ප්‍රධාන පියවර කීපයක් පහත දක්වේ.

## ◆ පාරිසරික ආරක්ෂාව සහතික කිරීමේ ක්‍රියාමාර්ග

ප්‍රධාන හෝ නිර්දිෂ්ඨ ව්‍යාපෘති ලෙස පවත්නා පාරිසරික බලපෑම් ගණනය කිරීමේ ක්‍රියාවලියට අමතරව මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන පරිසර ආරක්ෂාව සහතික කිරීමේ ක්‍රියාමාර්ග මගින් කර්මාන්ත මගින් පරිසරයට සිදුවන දූෂණය පාලනය කෙරේ. මෙම ක්‍රියාවලිය 1991. 07. 01 දින සිට ක්‍රියාත්මක වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ පරිසරයට අපද්‍රව්‍ය බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන සියළුම කර්මාන්ත විසින් ජාතික පාරිසරික පනත යටත් පාරිසරික ආරක්ෂාව පිළිබඳව සහතිකයක් ලබා ගත යුතු වේ. පාරිසරික ආරක්ෂාව පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා කර්මාන්ත කරුවන් විසින් සම්පූර්ණ කළයුතු ජාතික තත්ත්වයන්, මධ්‍යම පරිසර අධිකාරිය මගින් පෙන්වා දී ගැසට් පත්‍ර වල පළ කොට ඇත.

අද කුඩා කර්මාන්ත සඳහා අවශ්‍ය පාරිසරික ආරක්ෂාව පිළිබඳ සහතික පළාත් පාලන ආයතන මගින් ලබා දෙන අතර මහා පරිමාණයේ හෝ ලයිස්තුගත කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂාව පිළිබඳ



සහතිකය මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දෙනු ලැබේ. කෙසේ නමුදු ජාතික පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යවසායකත්ව ප්‍රවර්ධන කලාප වලට පාරිසරික ආරක්ෂාව පිළිබඳ සහතික ලබා දීමට කටයුතු කරන ලදී.

### ◆ ජාතික පාරිසරික ක්‍රියාකාරී සැළැස්ම (NEAP - 1998/2002)


1982 දී පත් කර ගන්නා ලද ක්‍රියාකාරී මණ්ඩලයක් මගින් ජාතික සංරක්ෂණ උපාය මාර්ගයක් සකස් කරන ලදී. ශ්‍රී ලංකාවේ පරිසරයෙහි ආරක්ෂාව හා කළමනාකරණය සඳහා ගත යුතු උපාය මාර්ග පිළිබඳව මෙම ලියවිල්ලෙහි අඩංගු වේ. මෙම ලියවිල්ල සකස් කිරීමේදී පරිසරයට සම්බන්ධ සියළුම අංශ පිළිබඳව සළකා බලා ඒවා අධ්‍යයනය කොට ඇත. ජාතික සංරක්ෂණ උපාය මාර්ග වලට අදාලව මධ්‍යම පරිසර අධිකාරිය මගින් පාරිසරික ක්‍රියාකාරී සැළැස්මක් සකස් කොට ඇත. පරිසරයේ ආරක්ෂාව හා කළමනාකරණය සඳහා විවිධ අංශ වලට අදාල ආයතන මගින් ක්‍රියාවට නැංවිය යුතු විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව එමගින් හඳුනා ගැනින. ඒ අනුව ලෝක බැංකුවේ ආධාරද සහිතව පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරියද සමග එක්ව වහාම ක්‍රියාත්මක කළයුතු පියවර හඳුනා ගනු ලැබින. 1994 - 1998 සඳහා පාරිසරික ක්‍රියාකාරී සැළැස්මක් සකස් කරන ලද අතර 1998 -2002 සඳහා කාලානුරූපව සකස් කරන ලද එහි වෙළුම දත් වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන මගින් ක්‍රියාවට නංවනු ලැබේ.

### ◆ පාරිසරික ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ කමිටු

වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය විසින් ජාතික පාරිසරික ක්‍රියාකාරී සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳව කමිටු/කාර්මිකායතන පිහිටුවා තිබේ. කර්මාන්ත, වෙරළබඩ හා සාගර, පාරිසරික සෞඛ්‍යය, නාගරික හා කෘත්‍රිම පරිසරය, ජෛව විවිධත්වය, ශක්තිය හා දේශගුණික වෙනස්කම්, භූමිය හා ඛණිජ සහ ජලය ලෙස අදල රේඛීය අමාත්‍යාංශයන් හි සහභාගීත්වයෙන් හා වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ සම සභාපතීත්වයෙන් යුතුව මෙම කමිටු අංශ අටක් යටතේ ස්ථාපනය කොට ඇත. පාරිසරික ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ කමිටු, අදල අංශයේ අදල ආයතන හා වගකීම් දරන්නන්ගෙන් සමන්විත වේ. පරිසර හා සංවර්ධන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීමේ කමිටුවෙහි සභාපතිත්වය දරණ මුදල් අමාත්‍යාංශය/එහි ලේකම් පාරිසරික ප්‍රතිපත්තිය හා කළමනාකරණය පිළිබඳ කමිටුවෙහි පරිපාලකයා වේ. පරිසර ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ කමිටුව/එහි සභාපති, කැඳවුම්කරුවන් සහ අනෙකුත් ප්‍රධාන වගකීම් දරන්නන්ගෙන් පරිසර හා සංවර්ධන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීමේ කමිටුව සමන්විත වන අතර පරිසර හා සංවර්ධන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීමේ කමිටුව විසින් ගනු ලබන ප්‍රධාන ප්‍රතිපත්ති තීරණ ක්‍රියාවට නංවනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශ හා අනෙකුත් අදල ආයතන හරහාය.

### ◆ ගෘහ නිර්මාණ ශිල්පීන් ගේ/භෞතික සැළසුම් ශිල්පීන් ගේ කාර්ය භාරය

මෙරට පරිසරය සැළසුම්කරණයේ හා කළමනාකරණයේ වඩාත් අවධානය යොමු කළයුතු අත්‍යවශ්‍ය අංශයක් ලෙස නාගරික හා මිනිසා විසින් නිර්මිත පරිසරය හඳුනාගෙන තිබේ. එබැවින් ක්‍රියාකාරී ගෘහ නිර්මාණ ශිල්පීන්/භෞතික සැළසුම් ශිල්පීන් වශයෙන් අප විසින් මෙරට පරිසර ආරක්ෂණය හා කළමනාකරණය සඳහා කළයුතු කාර්ය භාරය හඳුනාගැනීම වැදගත් වේ. පරිසරය ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම ගෘහ නිර්මාණ ශිල්පීන් හා භෞතික සැළසුම් ශිල්පීන් ලෙස බොහෝ විට අපගේ කාර්ය භාරය වනුයේ කලාපීයකරණය පිළිබඳව යෝජනා සකස් කිරීම, ඉඩම් පරිහරණය හා යහපත් කාර්යක්ෂම ඉඩම් පරිහරණයක් සඳහා සැළසුම් සකස් කිරීමයි. මෙම කර්තව්‍යය කරගෙන යාමේදී, පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ, රක්ෂිත ප්‍රදේශ, කලාත්මක හා සිත් ඇදගන්නා පරිසරයන් වැනි පරිසරයේ ආරක්ෂාවට හා කළමනාකරණයට බලපාන අත්‍යවශ්‍ය සහ සුවිශේෂී සාධක පිළිබඳව සොයා නොබලන ලද්දේ නම් එය අඩුවකි.



කලාපීයකරණය කෙරෙන මූලික පියවරෙහිදී වනාන්තර, රක්ෂිත අභය භූමි, තෙත් බිම්, පුරා විද්‍යාත්මක හෝ ඓතිහාසික වශයෙන් වැදගත් බිම් ආදී පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ ඇතිදැයි යථා පරිදි සොයා බැලිය යුතු අතර මේවා මූලික සැළසුම් පරීක්ෂණ ලැයිස්තු හෝ කෙටි සැකසුම්වල අන්තර්ගත කළයුතුය. එබඳු පරිසරයන් ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා එබඳු පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ සඳහා රක්ෂිතයන් හෝ අවරෝධක ප්‍රදේශ පවත්වා ගැනීම වැදගත් වේ.

එමෙන්ම අප විසින් අවධානය යොමු කළ යුතු තවත් ප්‍රධාන ගැටළු කිහිපයක් නම් කලාත්මක හා සිත් ඇදගන්නා සුළු පරිසරය පවත්වා ගැනීම, ස්වභාවික සෞන්දර්ය ආරක්ෂා කර ගැනීම ස්වභාවික පරිසරය වඩාත් වැඩි දියුණු කළහැකි ආකාරයට ගොඩනැගිලි නිර්මාණය කිරීම යනාදියයි. සෑම පියවරක්ම ගත යුත්තේ සිත්කළු හා කලාත්මක පරිසරය ආරක්ෂා වන ලෙස පමණක් ම නොවේ. ඒවා වැඩි දියුණු වන ලෙසත්ය. මෙය කළ හැකි වන්නේ සැළසුම් ක්‍රියාවලියේ මූලික මට්ටමේදී ම මෙම කරුණු පිළිබඳව සළකා බැලීමෙනි. යෝග්‍ය වන අදල ක්‍රියාකාරකම් හෝ ඉඩම් පරිහරණයන් එබඳු පාරිසරික සාධක වල වැදගත්කමට අනුව හඳුනාගෙන යෝජනා කළයුතුය.

### ◆ අවසන් පිවිසුම

පාරිසරික අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා සෑම අංශයකදීම සමාන වගකීම් බෙද ගනිමින් සමාජයීය ව්‍යවසායකත්වය හා ආයතනමය වගකීම පිළිගැනීම අවශ්‍ය වනු ඇත. නිෂ්පාදනය, විද්‍යාව හා තාක්ෂණය යනාදියෙහි සමාජ වර්ධනය හා ඉදිරියට යාමේ ක්‍රියාවලියේදී වෙනස් කිරීම් කිරීමට හෝ ආයෝජනය කිරීමට හෝ පමණක් නොව වර්ධනය කිරීමටද මිනිසා විසින් හැකියාවන් ගොඩනගා ගෙන ඇත. පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීමට හා යහපත් ජීවිතයක් නිර්මාණය කිරීම සඳහා ලොව පුරාම දැනුම හා අංගෝපාංග සංවර්ධනය වී තිබේ. අවශ්‍ය වන්නේ උනන්දුව ඇති සම්බන්ධීකරණය කරන ලද කඩිනම් හා ක්‍රමානුකූල ක්‍රියාකාරීත්වයයි. අප විසින් මෙම දැනුම ස්වභාවධර්මය හා අත්වැල් බැඳගත් සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ගොඩනැගීම සඳහා යොදගත යුතුය. වර්තමාන හා අනාගත පරම්පරාවන් වෙනුවෙන් මිනිස් පරිසරය ආරක්ෂා කළයුතු හා දියුණු කළයුතු වඩාත්ම යෝග්‍ය වූ ක්‍රමය වන්නේ මෙයයි.

**අනුර ජයතිලක**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ**

**වනාන්තර සහ වන ජීවීන් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති කිහිපයක්**

- 1907 - කැලෑ ආඥා පනත
- 1924 - පැළෑටි ආරක්ෂණ ආඥා පනත
- 1937 - වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත
- 1980 - ජාතික පාරිසරික පනත
- 1988 - ජාතික උරුම වන භූමි පනත

